## සංක්ෂිප්තය

සැමට සම අධ්‍යාපනය අවස්තාව ගැන දිගු කලක සිට අදහස් පළ කරනු ලැබුවත් වර්තමාන ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමවේදය දෙස අවධානය යොමු කරනු ලැබූ විට පෙනී යන්නේ අධ්‍යාපනයේ විෂමතා දැකිය හැකි බවයි. අධ්‍යාපනයට බලපාන විවිධ සමාජ පරිසර අතරින් පාසල් පරිසරයට, පවුල් පරිසරයට හිමි වන්නේ ප්‍රමුඛ ස්ථානයකි. නාගරික පහසුකම් සපිරි පාසල්වලට සාපේක්ෂව දුෂ්කර, අති දුෂ්කර ලෙස පාසල් දැකිය හැකි අතර මෙහි බොහෝ අඩුපාඩු දැකිය හැකිය. උතුරු නැගෙනහිර අම්පාර වැනි දුෂ්කර හා අඩු පහසුකම් ඇති දිස්ත්‍රික්කයක තර්පිත ගම්මාන පාසල් ආශ්‍රයෙන් කරනු ලබන මෙම අධ්‍යයනයෙන් සන්නද්ධ ගැටුම් පැවති ගම්මානවල සිසුන් අධ්‍යාපන ලැබීමේ දී වර්තමානයේ මුහුණ දෙන සමාජ ආර්ථික අභියෝග හඳුනා ගැනීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ විය.

පාසල් හා පවුල් සමාජය ආර්ථික සාධක ආශ්‍රිත විචල්‍යය හා සිසුන්ගේ අධ්‍යාපනික සාධනය ලැබීමේ දී මුහුණ දෙන අභියෝග හඳුනා ගැනීම සඳහා මෙම අධ්‍යයනයේ අරමුණු 04 ක් ඔස්සේ පර්යේෂණයට ලක් කරන ලදී. දෙමව්පියන්ගේ ආර්ථික සමාජීය අධ්‍යාපන තත්ත්වය මත පාසල් සිසුන් මුහුණ පාන අභියෝග හඳුනා ගැනීම, පවුල් සංස්කෘතිය ඉගෙනුම් පරිසරය මත සිසුන් අධ්‍යාපනයේදී මුහුණපාන අභියෝග හඳුනා ගැනීම, පාසලේ ඇති භෞතික සම්පත් ඌනතාව මත සිසුන් මුහුණ දෙන අභියෝග විමසා බැලීම,පාසලේ මානව සම්පත් කළමනාකරණය හා සිසුන් මුහුණ දෙන අභියෝග විමසා බැලීම අරමුණ විය.

පර්යේෂණ ක්‍රමවේදය ලෙස විස්තරාත්මක පර්යේෂණ ප්‍රවේශය යටතේ නියැදි සමීක්ෂණ ක්‍රමය අනුගමනය කරන ලදී. අධ්‍යයනයට අවශ්‍ය දත්ත රැස් කිරීමට නියැදි කිහිපයක් තෝරා ගන්නා ලදී. අම්පාර දිස්ත්‍රික්කයේ මහඔය අධ්‍යාපන කලාපයේ 1 සී වර්ගයේ හා 2 වර්ගයේ ග්‍රාමීය පාසල් 05 ක් අම්පාර අධ්‍යාපන කලාපයේ 1 සී වර්ගයේ පාසල් 01 ක සිසුන් 134 ක් ගුරුවරුන් 30 ක් හා විදුහල්පතිවරු 06 දෙනා මෙම නියැදියට අයත් විය. ප්‍රශ්නාවලි හා සම්මුඛ සාකච්ඡා ෂෙඩියුල මඟින් දත්ත රැස් කරන ලදී. වගු, ප්‍රතිශත, ප්‍රස්තාර සහ වෙනත් සංඛ්‍යා විද්‍යාත්මක ක්‍රම මඟින් දත්ත විශ්ලේෂණය සිදු කරන ලදී. දත්ත විශ්ලේෂණයේ දී අනාවරණය වූ කරුණු අනුව පාසල් සාධක යටතේ පාසල්වල භෞතික සම්පත් සළකා බලන ලද විෂයන්ගේ ප්‍රතිඵල කෙරෙහි බලපා නොමැති බව නිගමනය විය. පාසලේ මානව සම්පත් හා විෂය ප්‍රතිඵල අතර මෙන්ම විෂය ඉගැන්වීමේ කටයුතු

කළමනාකරණය හා සාධනය අතර ධන සම්බන්ධතාවක් පැවතුණි. සමාජ ආර්ථික සාධක යටතේ සළකා බලන ලද විචල්‍යයන්හි බලපෑම ප්‍රමාණාත්මකව වෙනස් වී ඇත.

පියාගේ රැකියාව මවගේ අධ්‍යාපන මට්ටම ආදිය සාධනය කෙරේ දුබල ලෙස බලපාන ලදී.පවුලේ මාසික ආදායම නිවසේ අධ්‍යාපන සම්පත් කෙරේ ප්‍රබල ලෙස බලපාන ලදී.

සන්නද්ධ ගැටුම් පැවැති අති දුෂ්කර පාසල්වල පවතින මානව සම්පත් හා භෞතික සම්පත්වල ඉහළ නැංවීම සඳහා රජය විසින් ගත යුතු ක්‍රියා මාර්ග හා ප්‍රතිපත්ති කිහිපයක් යෝජනා කරන ලද අතර 5 වසර ශිෂ්‍යත්වය යටතේ දරුවන්ට පාසල් ලබා දීමේ දී හා අ.පො.(ස.පෙළ) සමත් ලකුණු තීරණය කිරීමේ දී විශේෂ සැලකිල්ලක් මෙම ප්‍රදේශයේ සිසුන් සඳහා සලකා බලන ලෙස යෝජනා කරන ලදී.

ඉතාම දැඩි දුෂ්කරතා මධ්‍යයේ අධ්‍යාපනය ලබන මෙවැනි ප්‍රදේශයන්හි සිසු දරු දැරියන්ගේ අධ්‍යාපන තත්ත්වය ඉහළ නංවා අනාගත වැඩ ලොවට අභියෝගාත්මක පුද්ගලයෙකු බිහි කිරීමේ හැකියාව උදා කර ලීමට මෙම පර්යේෂණයේ තොරතුරු අල්ප මාත්‍රයකින් හෝ දායක වේ යැයි අපේක්ෂා කරමි.